# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2258/11 - 2021 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2021.12.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ වූ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, දෙමෝදර ජල සම්පාදන ක්‍රමය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ දෝව ජල ගබඩා ටැංකිය හා පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත් කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/BD/319

2021 නොවැම්බර් මස 29 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර"
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 69ඩී, දෝව ග්‍රාම නිලධාරි වසමේ, දෝව ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු නිශාන්ත බුලත්ගේ මහතා විසින් 2021.03.06 දිනෙන් අඳින ලද අංක 2021/07 සැලැස්මේ කැබලි අංක 1 ලෙස දැක්වෙන දෝව විහාරය වත්ත නැමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.01012 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

*උතුරට* - දෝව පන්සල් ඉඩම
*නැගෙනහිරට* - දෝව පන්සල් ඉඩම
*දකුණට* - දෝව පන්සල් ඉඩම
*බටහිරට* - අංක 2021/07 සැලැස්මේ කැබලි අංක 2

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. දෝව රජමහා විහාරය,
දෝව.

EOG 12 - 0129

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ වූ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, උඩුගම ජල යෝජනා ක්‍රමය යටතේ රොන්මඩ වියලනය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත් කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/GL/322

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර"
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 219 A, හෝමදොල ග්‍රාම නිලධාරි වසමේ, උඩුගම ගමේ, හෝමදොල වත්ත නැමැති ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් 20 ක පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

*උතුරට* - හෝමදොල වතුයායේ අභ්‍යන්තර මාර්ගය.
*නැගෙනහිරට* - ජල සම්පාදන මණ්ඩලයේ කාර්යාලය හා අංගනය.
*දකුණට* - හෝමදොල තේ කර්මාන්ත ශාලාවේ මාර්ගය.
*බටහිරට* - හෝමදොල වතුයාය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : වටවල වතු සමාගම,
නො. 754/5,
නුවර පාර,
වෙදමුල්ල,
කැලණිය.

EOG 12 - 0130

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ වූ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, උඩුගම ජල යෝජනා ක්‍රමය යටතේ සම්පීඩන පොම්පාගාරයක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත් කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/GL/323

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර"
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 218 D, උක්ඕවිට ග්‍රාම නිලධාරි වසමේ, උඩුගම ගමේ, හෝමදොල වත්ත T - 06 නැමැති ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් 10 ක පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

*උතුරට* - හෝමදොල වත්ත ඉඩම.
*නැගෙනහිරට* - ගාල්ල - උඩුගම මාර්ගය.
*දකුණට* - හෝමදොල වත්ත ඉඩම.
*බටහිරට* - හෝමදොල වත්ත ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : වටවල වතු සමාගම,
නො. 754/5,
නුවර පාර,
වෙදමුල්ල,
කැලණිය.

EOG 12 - 0131